**මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලින් සභාවට ලබාදී තිබූ එකතුව රු. 9,916,895ක මූල්‍ය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගෙන ඇති බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැඩ අවසන් නොවූ ඉදිකිරිමකට අදාල රු.1,550,000ක ඇස්තෙම්න්තුගත පිරිවැය ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වැඩ අවසන් කර ගෙවීම් බිල්පත් ලැබීමෙන් පසුව එම වටිනාකම නිරවුල් කරන බව. | -එම- |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍ර ලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි (ආ) ඡේදය | මාණ්ඩලික නොවන නිලධාරීන් 09කට සමාලෝචිත වර්ෂය තුළදී තත්ත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් අවස්ථා 13කදී රු.317,251ක් ලබාදී තිබුණි. | මාණ්ඩලික නිලධාරීන්ට පමණක් ලබාදීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | ආපසු ගෙවිය යුතු ලංසු තැන්පතු 04ක් සහ සමාජ වගකීම් දරන ආයතනවලට ආපසු ගෙවිය යුතු එකතුව රු.202,107ක් වූ ඇප තැන්පතු පසුගිය වර්ෂ 01ක සිට වර්ෂ 02ක කාලයක් නිරවුල් කර නොතිබුණි. | ඇප තැන්පතු නිදහස් කිරීමට පියවර ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,319,206ක් වූ අතර, ඊට අනුරූපීව  ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,179,237ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | 4,000 | 4,000 | - | - | - | - | - |
| කුලී | 540,000 | 624,870 | 620,850 | 220,582 | 665,000 | 550,934 | 479,434 | 216,562 |
| බලපත්‍ර ගාස්තු | 165,000 | 253,800 | 253,800 | - | 290,000 | 274,876 | 274,876 | - |
| වෙනත් ආදායම් | 23,479,000 | 24,104,182 | 35,148,958 | 12,297,000 | 16,527,000 | 19,438,101 | 3,875,277 | 23,342,595 |
| එකතුව | **24,184,000** | **24,986,852** | **36,027,608** | **12,517,582** | **17,482,000** | **20,263,911** | **4,629,587** | **23,559,157** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචන වර්ෂයේ සහ පසුගිය වර්ෂවලට අදාලව පාර්ශව 42 කින් අයකළ යුතු එකතුව රු.1,057,124ක කඩකාමර කුලී සහ දඩ ගාස්තු පැනවීම්, වෙළෙඳ පොල බදුකුලී හා සභාවේ බර වාහන සේවාවලින් ලැබියයුතු කුලිගාස්තු පසුගිය වර්ෂ 01ක සිට වර්ෂ 11ක් දක්වා කාලයක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග නොගෙන හිඟහිටි ලෙස අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම, වර්ෂයකට අධික කාලයක සිට අයකර ගතයුතුව පැවැති මුද්දර ගාස්තු එකතුව රු.329,330ක්ද පැවැතුණි. | පොත්වලින් කපාහැරීමේ ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. පසුගිය වර්ෂවලට අදාල බර වාහන හිඟකුලී මුදල් සම්බන්ධයෙන් අදාළ අයට දැනුම්දීම් නිකුත් කර ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | නියමිත ආදායම් කඩිනමින් අප්‍රමාදව රැස්කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ සභාවේ අරමුදලින් එකතුව රු.802,515ක පිරිවැයකින් ඉදිකළ ගාන්ධි ජී ප්‍රජා මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා නියමිත පරිදි වැඩ ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් මේ දක්වා වැඩ අවසන් නොවී පැවැතුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මගින් ජනතාවට ලබාදීමට අපේක්ෂා කළ සුහසාධන සේවාවන් පසුගිය වර්ෂ 02කට අධික කාලයක සිට සැලසීමට නොහැකිවී තිබුණි. | කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා 2024 වර්ෂයේ අරමුදල් වෙන්කර ඇති බව. | ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා නියමිත පරිදි ඇස්තමේන්තු සකස්කර සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | බදුකුලී පදනමින් සහ කුලී පදනමින් ලබාදීම සඳහා පොන්නගර් සහ පාන්ඩියන්කුලම් / නට්ටාංකන්ඩල් ආදි ප්‍රදේශයන්හි ඉදිකළ වෙළෙඳ පොලවල් සහ එහි කඩකාමර සංකීර්ණ පසුගිය වර්ෂ 01ක සිට වර්ෂ 05ක් දක්වා කාලයක් නිෂ්කාර්යව පැවැතුණු අතර මෙහි වටිනාකමද තක්සේරු කර නොතිබුණි. | පුවත්පත් මගින් ප්‍රචාරණ දැන්වීම් පලකර තිබූ නමුත් කඩකාමර ලබාගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවූ බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අරමුදල් සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් ක්‍රියාත්මක කළ එකතුව රු.53,481,480ක්වූ විවිධ ගොඩනැගිලි ඉදිකිරීම් සහ පිරිවැය එකතුව රු.3,190,628ක් වූ ප්‍රතිසංස්කරණ කාර්යයන් සිදුකළ පොදු ළිං 18 ක් පිහිටි ඉඩම් සභාවට අයත් නොවූ නමුත් ඒවා සභාවට පවරා ගැනීමට මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සභාවට පවරා ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය නිසි පරිදි වර්ග කර රැස් නොකර රැගෙන ගොස් නට්ටාංකන්ඩල් යන ස්ථානයේ පිහිටි ආරක්ෂිත වැටක් රහිත කසල බැහැර කිරීමේ ස්ථානයට බැහැර කර තිබුණි. විවිධ සතුන් මෙම කසල ආහාරයට ගෙන ඒවායේ කොටස් පරිසරය පුරා විසිරුවා තිබුණි. | කසල බැහැර කරන ස්ථානය වටා වැටක් ඉදිකිරිමටත් කසල වර්ග කිරීමටත් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | දිරන කසල කාබනික පොහොර නිෂ්පාදනයට හෝ වෙනත් විකල්ප භාවිතයන් සඳහා ලක්කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |